**<u>බස්නාහිර පළාත් සභාව</u>**

**බස්නාහිර පළාත් සෞඛ්‍ය දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය**

**බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ**

**(PL -01-2006)**

**සෞඛ්‍ය කාර්ය සහායක (කණිෂ්ඨ) III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීම.**

01. බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව හා ඒ යටතේ ඇති රෝහල් හා ආයතනවල ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය (PL-1) දෙපාර්තමේන්තුගත සෞඛ්‍ය කාර්ය සහායක (කණිෂ්ඨ) තනතුරෙහි පවතින පුරප්පාඩු <u>88 ක්</u> පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. **සුදුසුකම්**

02.1 **අධ්‍යාපන සුදුසුකම්**

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් ඇතුළුව විෂයන් හයක් සමත් වී තිබීම. (මෙම සුදුසුකම සහිත ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති විටදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටි අයදුම්කරුවන්ද බඳවා ගැනීම සඳහා සලකා බලනු ලැබේ).

02.2 **කායික සුදුසුකම්**

සෑම අපේක්ෂකයෙකුම බස්නාහිර පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

02.3 **වෙනත්**

I. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. අයදුම්කරු යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
III. අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය තිබිය යුතුය. ග්‍රාම නිලධාරී සහතිකය මගින් පදිංචිය සනාථ කල යුතුවේ.
IV. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම් සම්පූර්ණ කල බවට අයදුම්පත්‍ර කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන එනම් 2026.11.06 දිනට එම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය. එමෙන්ම අයදුම්කරුවන් විසින් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල සහතික වල පිටපත් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කල යුතුය.

03. **වයස** - අවුරුදු 18 නොඅඩු 45ට නොවැඩි විය යුතුය.

04. **බඳවා ගැනීමේ ක්‍රමය**

04.1 **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය**

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී ඉටු කර ගැනීමට අපේක්ෂිත මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමද ව්‍යුහගත පරීක්ෂණයේදී සිදු කරනු ලැබේ.

CamScanner

04.2 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය 100 | තෝරා ගැනීමට සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම්<br><br>බඳවා ගැනීමේ මූලික අධ්‍යයන සුදුසුකම් ලෙස දක්වා ඇති අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී සාමාර්ථ ලබා ගෙන ඇති විෂයයන් හය හා සම්මාන දෙකට අමතරව සමත්ව ඇති විෂයයන් සඳහා ලබා ඇති සාමාර්ථ සඳහා විෂයයන් දෙකක උපරිමයකට යටත්ව ලකුණු ලබා දේ.<br><br>සාමාන්‍ය සාමාර්ථයකට ලකුණු - 4<br>සම්මාන සාමාර්ථයකට ලකුණු - 6<br>අධි සම්මානයකට ලකුණු - 8<br>විශිෂ්ඨ සම්මානයකට ලකුණු - 10 | 20 | 40%<br><br>උපරිම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් කුසලතා අනුපිළිවෙල මත පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව තෝරා ගනු ලැබේ. |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව (සාමාන්‍ය දැනීම,සන්නිවේදන කුසලතාවය) | 75 | |
| පෞරුෂත්වය | 05 | |
| එකතුව | 100 | |

05. වැටුප් ව්‍යුහය හා වැටුප් පරිමාණය (මාසික)

රු.40,000-10x450-10x490-10x540-12x590-රු.61,880 (PL 1-2006 A,) රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 10/2025 උපලේඛන II අනුව ) (2026 වර්ෂයේ ආරම්භක වැටුප රු 38,863 වේ)

06. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි

I. පුරප්පාඩු ප්‍රමාණය හා අවශ්‍යතාවය මත ඔබ පදිංචි දිස්ත්‍රික්කයම නොලැබී යා හැක. කුසලතාවය හා පවතින පුරප්පාඩු ප්‍රමාණය මත පත්කරනු ලබන සේවා ස්ථානයේ අනිවාර්යයෙන් වසර 05 ක් සේවය කල යුතුය. එම කාලය තුළ ස්ථාන මාරු වීම සලකා බලනු නොලැබේ.

II. පත් කරනු ලබන තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගත් අයදුම්කරුවන්ට හිමි විශ්‍රාම වැටුප් පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතු වේ. තවද තෝරා ගනු ලබන නිලධරයන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය විසින් විටින් විට නියම කරන ආකාරයට ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

III. මෙම පත්වීම තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්වන අතර බඳවා ගෙන වසර(03) ඇතුලත පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

IV. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට පත්වී වසර 05ක් ඇතුලත නියමිත රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාව ලබා ගත යුතුය.

CS CamScanner

V. බස්නාහිර පළාත් සභා කාර්ය පරිපාටික රීතිවලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයටද , බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් කලින් කල පනවනු ලබන රෙගුලාසි හා නියෝග වලටද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන වෙනත් රෙගුලාසි නොහොත් නියෝගවලටද, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු පොදු විධිවිධානවලටද මෙම පත්වීම යටත් වේ.

07. **අයදුම් කළ යුතු ක්‍රමය.**

I. සියලු අයදුම්කරුවන් තම අයදුම්පත ආදර්ශ අයදුම්පත්‍රය අනුව සුදු A4 කඩදාසියක පිළියෙල කර සිය අත් අකුරින්ම පැහැදිලි ලෙස සම්පූර්ණ කර එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ "සෞඛ්‍ය කාර්ය සහායක (කණිෂ්ඨ) තනතුර සඳහා බඳවා ගැනීම 2026" යනුවෙන් සඳහන් කර 2026.11.06 දිනට හෝ එදිනට පෙර ලැබෙන පරිදි

ලේකම්<br>
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා,කාන්තා කටයුතු හා සභා කටයුතු අමාත්‍යාංශය - බස්නාහිර පළාත<br>
8 වන මහළ, බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ල,<br>
අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,<br>
බත්තරමුල්ල.

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.(http://healthmin.wp.gov.lk) වෙබ් අඩවියෙන් අයදුම්පත්‍රය බාගත කර ගත හැක)

II. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2026.11.06 දින වේ.

08. **අත්සන සහතික කිරීම.**

රජයේ පාසලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු විසින් අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන සහතික කර තිබිය යුතුය.

09. **සාවද්‍ය තොරතුරු සැපයීම.**

අයදුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. යම් අයදුම්කරුවකු සපයා ඇති යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව ඕනෑම අවස්ථාවකදී අනාවරණය වුවහොත් ඊට අදාල නෛතික ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. **බඳවා ගැනීමේ කොන්දේසි**

I. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් 2026.11.06 දිනට සම්පූර්ණ කර තිබිය යුතුය. නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් පත්වීම් ලැබීමට නුසුදුස්සෝ වෙති.

CamScanner

II. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

III. අයදුම්පතක් ලැබුන බව දන්වා එවනු නොලබන අතර ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

IV. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර ඒ බව අයදුම්පතෙහි ලිපිනයට දැනුම් දෙනු ලැබේ.

V. සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී අපේක්ෂකයාගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කල වලංගු ජාතික හැඳුනුම්පත,වලංගු රියදුරු බලපත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම ලියවිලි හැර වෙනත් කිසිදු ලියවිල්ලක් පිළිගනු නොලැබේ.

VI. සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තෝරාගනු ලබන අතර එසේ තෝරා ගන්නා ලද නිලධරයන් බස්නාහිර පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ පවතින රෝහල් හා ආයතනවල පුරප්පාඩු සඳහා පත්කිරීමට නියමිතය.

VII. මෙම තනතුර සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම නිවේදනයේ ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් ගැටලු සහගත තත්වයක් ඇතිවුවහොත් ඒ පිළිබඳව බස්නාහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

එල්.ඒ කළුකපුආරච්චි,
ලේකම්,
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා,කාන්තා කටයුතු හා සභා කටයුතු අමාත්‍යාංශය - බස්නාහිර පළාත

8 වන මහළ බස්නාහිර පළාත් සභා
ගොඩනැඟිල්ල,
අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

2026 ඔක්තෝම්බර් මස 06. දින

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ
ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ (PL-01-2006)
සෞඛ්‍ය කාර්ය සහායක (කණිෂ්ඨ) III ශ්‍රේණිය
සඳහා බඳවා ගැනීම සඳහා වන අයදුම්පත්‍රය

1. (i) මුලකුරු සමඟ අගට යෙදෙන නම (සිංහලෙන්) : ..........................................

(ii) සම්පූර්ණ නම (සිංහලෙන්) : ..........................................
..........................................

(iii) මුලකුරු සමග නම Mr/Mrs/Miss (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..........................................

(iV) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..........................................

2. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

3. පෞද්ගලික විස්තර

i. ස්ථිර ලිපිනය : ..........................................
..........................................
..........................................

ii. ග්‍රාම නිලධාරී කොට්ඨාශය හා අංකය : ..........................................

iii. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය : ..........................................

iv. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ..........................................

v. ඉහත ලිපිනයේ පදිංචිව සිටින්නේ කවදා සිට ද : ..........................................
*(පදිංචිය ග්‍රාම නිලධාරී සහතිකයක් මඟින් සනාථ කළ යුතු ය)*

vi. දුරකථන අංක : ..........................................

vii. උපන් දිනය : ..........................................

viii. 2026.11.06 දිනට වයස : අවුරුදු .............. මාස .............. දින

ix. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී......... පුරුෂ ..........

x. විවාහක /අවිවාහක : ...........

4. අධ්‍යාපන සුදුසුකම් (සනාථ කර ගැනීම සඳහා අධ්‍යාපන සහතික වල පිටපතක් එවිය යුතුයි.)

වර්ෂය ---------------- අ.පො.ස. (සා.පෙළ) විභාග අංකය (පළමුවර) : ..........................................

| විෂයය | සාමාර්ථය (වර්ෂය) | විෂයය | සාමාර්ථය (වර්ෂය) |
|---|---|---|---|
| . .............................. | (.............) | . .............................. | (.............) |
| . .............................. | (.............) | . .............................. | (.............) |
| . .............................. | (.............) | . .............................. | (.............) |
| . .............................. | (.............) | . .............................. | (.............) |

වර්ෂය ---------------- අ.පො.ස. (සා.පෙළ) විභාග අංකය (දෙවන වර) : ..........................................

| විෂයය | සාමාර්ථය (වර්ෂය) | විෂයය | සාමාර්ථය (වර්ෂය) |
|---|---|---|---|
| . .............................. | (.............) | . .............................. | (.............) |
| . .............................. | (.............) | . .............................. | (.............) |
| . .............................. | (.............) | . .............................. | (.............) |
| . .............................. | (.............) | . .............................. | (.............) |

CS CamScanner

5. ඔබ කිසියම් සාපරාධී වරදකට උසාවියෙන් දඬුවම් ලබා ඇත්නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

6. මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම් පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇතොත් විභාගයට / සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය / සම්මුඛ පරීක්ෂණයට කැඳවීම අවලංගු කල හැකි බවත්, තෝරා ගැනීමෙන් පසුව ඒ බව හෙළිවුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

දිනය : ..............................

..............................
අයදුම්කරුගේ අත්සන

---

7.අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .............................................. මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව වශයෙන් හඳුනන බවත්, ඔහු/ඇය මා ඉදිරිපිටදී .................... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

..............................................
සහතික කරන නිලධාරියාගේ අත්සන

සහතික කරන ලද නිලධාරියාගේ,

නම : ... ... ... ... ... ... ... ... ... ... ..

තනතුර : ... ... ... ... ... ... ... ... ... ... ..

දිනය :... ... ... ... ... ... ... ... ... ... ... .

(නිල මුද්‍රාව)